# කෘෂි කාලගුණ උපදේශනය 2022 අගෝස්තු, සැප්තැම්බර් සහ ඔක්තෝබර් මාස සඳහා

## ශ්‍රී ලංකා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

අගෝස්තු මාසයේදී දිවයිනේ බස්නාහිර, දකුණ, මධ්‍යම, සබරගමුව, වයඹ හා ඌව පළාත් වලට දිගු කාලීන සාමාන්‍ය අගයට වඩා මදක් අඩු වර්ෂාපතනයක් පුරෝකතනය කළ හැක. වෙනත් වසර වල ලැබෙන සාමාන්‍ය අගයට අසන්න වර්ෂාපතනයක් උතුරු පළාතට සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අපේක්ෂා කළ හැක.

සැප්තැම්බර් මාසයේදී දිවයිනේ උතුරු පළාතට සාමාන්‍යයට ආසන්න වර්ෂාපතනයක් අපේක්ෂා කළ හැකි අතර, දකුණු හා ඌව පළාත් වලට වෙනත් වසරවල සාමාන්‍යයට වඩා තරමක් අඩු වර්ෂාපතනයක් අපේක්ෂා කළ හැකිය.

ඔක්තෝබර් මාසයේදී දිවයිනේ බොහෝ ප්‍රදේශ වලට සාමාන්‍යයට වඩා තරමක් අඩු වර්ෂාපතනයක් පුරෝකතනය කළ හැකිය.

- සැප්තැම්බර් මස අග භාගයේ හා ඔක්තෝබර් මාසයේදී වායුගෝලයේ ඇති විය හැකි අඩු පීඩන කලාප හා අවපාත තත්ත්වයන් නිසා අනපේක්ෂිත, කෙටි කාලීන, තද වැසි ඇති වීමේ සම්භාවිතාවක් පවතී.

## තුන්වන අතරමැදි කන්නය - මුං වගාව

- තුන්වන අතරමැදි කන්නය සඳහා මුං වගාව පමණක් නිර්දේශ කරනු ලබන අතර අගෝස්තු මස මැද භාගය වන විට වත් 2022 යල කන්නයේ අස්වනු නෙලා අවසන් කරන ගොවිමහතුන්ට මේ සඳහා යොමු විය හැකිය.
- එම ගොවිමහතුන් වගාව සාර්ථක කර ගැනීම සඳහා පහත සඳහන් කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම වැදගත් වේ.
  - වගා බිම පුරා ඒකාකාරව පැතිරුණු වගාවක් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. මේ සඳහා අක්කරයට මුං බීජ කිලෝ 10 ක් පමණ යොදා ගැනීම සුදුසුය.
  - වෛරස් රෝග පැතිරීමේ අවධානම අඩු කර ගැනීම සඳහා බීජ ප්‍රතිකාර ක්‍රම වෙත යොමු වීම වැදගත්ය.
  - වෛරස් ආසාදන හැකි ඉක්මනින් හඳුනාගෙන, අසාදිත ශාක ක්ෂේත්‍රයෙන් ඉවත් කර, විනාශ කර දැමිය යුතුය.
  - මේ වන විට කන්න දෙකක් පමණ පසට සැළකිය යුතු රසායනික පොහොර ප්‍රමාණයක් යෙදීම සිදු නොවූ බැවින්, සපයා ගත හැකි පරිදි යූරියා, කාබනික පොහොර හෝ දියර පොහොර වගාවට යෙදීම සුදුසුය. (පසේ ප්‍රමාණවත් පොහොර ප්‍රමාණයක් පවතී නම්, පොහොර යෙදීම අවශ්‍ය නොවේ.)
- ක්‍රමවත්ව බිම් සකස් කර වගාව සිදු කරන ගොවිමහතුන් මෙන්ම ඉපනැල්ලේ මුං වගාව සිදු කරන ගොවිමහතුන් ද වගා බිම අශ්‍රිතව ක්‍රමවත් ලෙස කාණු පද්ධතිය සකස් කර ජලය බැසයාමට සැලසිය යුතුය. ජලය වගා බිමේ දින දෙක තුනක් රැදී තිබීම නිසා වගාව රෝග වලට භාජනය වීම, වර්ධනය බාල වීම හා අස්වැන්න අඩු වීම සිදු විය හැකිය.
- අස්වැන්න නෙලන කාලයේ දී තද වර්ෂාපතනයක් පවතී නම්, ඒ දින කීපය මගහැර අස්වැන්න නෙලීම සිදු කිරීම සුදුසුය. වර්ෂාව පවතින අවස්ථාවේදී අස්වැන්න නෙලා වෙලීමේදී බීජ වල පුස් ඇති වීමේ හැකියාව වැඩිය.

## වී වගාව

- අස්වනු නෙලන අවධියේ සිටින වී ගොවීන්, අස්වනු නෙලන දින තීරණය කිරීමේදී කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන කෙටි කලින් අනාවැකි කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය. නිරිත දිග මෝසම් සුළං මගින් වැසි ලැබෙන මෙම කාල සීමාව තුළ වරින් වර කෙටි කාලීන වැසි ඇති වීම සිදු වන බැවින්, එම වැසි මග හැර අස්වනු නෙලීම අස්වැන්නේ ගුණාත්මක භාවය සඳහා වැදගත් වේ.
- පවතින වැසි සහිත කාලගුණ තත්වය යටතේ අස්වනු නෙලා ගැනීමේදී, අස්වැන්න වියලා ගැනීම පිළිබඳ විශේෂ අවධානය යොමු කිරීම වැදගත්ය. විශේෂයෙන්ම බිත්තර වී නිෂ්පාදනයේදී, වැසි සහිත කාල වල අස්වනු නෙලා ගැනීමේදී අස්වැන්න නිසි ප්‍රමිතියට වියළා ගැනීම කළ යුතුය. එසේම රෝග බීජ හා වල් පැළෑටි බීජ වලින් තොරව පිරිසිදු තත්ත්වයෙන් අස්වැන්න සකසා ගැනීමට අවධානය යොමු කළ යුතුය.
- වියළි හා අතරමැදි කලාප වල වගා කටයුතු සිදු කරනු ලබන ගොවි මහතුන් වරින් වර ලැබෙන කෙටි කාලීන වර්ෂාව ප්‍රයෝජනයට ගනිමින් වාරි ජලය ඉතිරි කර ගැනීමට කටයුතු කිරීම එළඹෙන 2022/23 මහ කන්නය සඳහා වැදගත් වනු ඇත.
- 2022 යල කන්නයේ අස්වනු නෙලීමේ කටයුතු අගෝස්තු මස අවසන් වන විට නිමා කර ගැනීමට හැකියාව පවතින ගොවි මහතුන්ට සැප්තැම්බර් මස අග භාගයේ ඇති වීමට පුරෝකතනය කර ඇති වැසි සමග මහ කන්නය සඳහා බිම් සකස් කිරීමේ කටයුතු ආරම්භ කිරීමෙන්, එළඹෙන 2022/23 මහ කන්නය සඳහා ජලය සුරක්ෂිත කර ගත හැකිය.
- කන්නය නියමිත කාලයට හෝ ඊට පෙර අරඹන ගොවි මහතුන්ට වැඩි වයස් කාණ්ඩ වල (4 - 4 $^1/_2$) වී වර්ග වලට යොමු වීමේ අවස්ථාව පවතී.


### කෘෂි කාලගුණ උපදේශක කමිටු සාමාජික සාමාජිකාවන්

- අනුෂා වර්ණසූරිය මිය (අධ්‍යක්ෂ - දේශගුණ විපර්යාස සහ පර්යේෂණ) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
- ඉංජිනේරු ඩී. අබේසිරිවර්ධන මහතා (අධ්‍යක්ෂ - ජල කළමණාකරන) වාරිමාර්ග දෙපාර්තමේන්තුව.
- ඩී.කේ.ඩබ්.ආර්. සෙනවිරත්න මිය (අධ්‍යක්ෂ-කෘෂිකර්ම) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
- ඩී.ඩී. පෙරේරා මහතා (තාක්ෂණික නිලධාරි - ජල කළමනාකරණ අංශය) ගොවි ජන සංවර්ධන දෙපාර්තමේන්තුව
- ආචාර්ය එම්.ඒ.පී.ඩබ්.කේ. මලවිආරච්චි මහතා (ප්‍රධාන කෘෂි විද්‍යාඥ - කෘෂි විද්‍යාව) ක්ෂේත්‍රබෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය
- කේ.ඒම්.ඩී.ඩබ්.පී. නිශාන්ත මහතා (අතිරේක අධ්‍යක්ෂ, පැළෑටි සංරක්ෂණ සේවාව) උද්‍යානබෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය
- එල්.සී. සිල්වා මහතා (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - පර්යේෂණ - ශාකකායික විද්‍යා) වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය
- ටී.ඒම්.පි.පී.එස්.පී. තෙන්නකෝන් මිය (නියෝජ්‍ය අධ්‍යක්ෂ) ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය

### විශේෂ ස්තුතිය

- ගාමිණී සේනාරත්න මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ - බෝග සම්බන්ධීකාරක - මුං වගාව) - සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථානය, අගුණකොලපැලැස්ස
- එම්. එස් තිලකසිරි මහතා (නියෝජ්‍ය අධ්‍යක්ෂ - කෘෂිකර්ම - බීජ වී) බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය

### සම්පාදනය

- අරුණි බී. අබේසේකර මිය (සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ - කෘෂි දේශගුණ හා දේශගුණ විපර්යාස) ස්වභාවික සම්පත් කළමණාකරණ මධ්‍යස්ථානය